# අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නායයාමේ අවදානමට ලක් වූ ප්‍රජාව නැවත පදිංචි කිරීම පිළිබඳ ආකල්පඃ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්

එල්.කේ.ආර්. සෙව්වන්දි - සමාජවිද්‍යා අධ්‍යයනාංශය

නායයාම් යන ස්වාභාවික ආපදාව ලෝකය පුරාම පාහේ දක්නට ලැබෙන්නකි. මෙම පර්යේෂණයෙන් සිදු කරනු ලැබුවේ නායයාම් අවදානමට ලක් වූ අගලවත්ත ප්‍රදේශයේ ප්‍රජාව නැවත පදිංචි කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් දක්වන ආකල්පවල ස්වභාවය පිළිබඳව අධ්‍යයනයකි. නායයාම් අවදානම හේතුවෙන් නැවත පදිංචි කළ ප්‍රජාව ඒ පිළිබඳව දක්වන ආකල්පවල ස්වභාවය කවරාකාරද? යන පර්යේෂණ ගැටලුව මත පදනම්ව පර්යේෂණය සිදු කරන ලදි. නායයාම් අවදානමට ලක් වූ ප්‍රජාවක් නව ප්‍රදේශයකට විතැන් වීමත් සමඟ ඒ සම්බන්ධයෙන් ඔවුන් තුළ පවතින ආකල්ප පිළිබඳව සොයා බැලීම පර්යේෂණ අරමුණ විය. අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදා ගැනුණි. සමස්ත සංගහනය 209කි. එම සමස්ත සංගහනයම නියෝජනය වන ලෙස පවුල් 21ක් නියදිය වශයෙන් යොදා ගනිමින් පර්යේෂණය සිදු කරන ලදි. ප්‍රාථමික සහ ද්විතීයික යන දත්ත දෙවර්ගයම යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී සමීක්ෂණ ක්‍රමය යටතේ ප්‍රශ්නාවලී ක්‍රමයත්, සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් යොදා ගනිමින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දත්ත දෙවර්ගයම ඇසුරින් මිශ්‍ර පර්යේෂණ ක්‍රමයක් මෙහිදී යොදා ගන්නා ලදී. ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමේදී නියැදි ක්‍රමය ලෙස සරල සසම්භාවී නියදි ක්‍රමයක් වන ලොතරැයි ක්‍රමය යොදා ගනු ලැබිණි. දත්ත විශ්ලේෂණයේදී ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා Microsoft Excel මෘදුකාංගය යොදා ගන්නා ලදී. ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යොදා ගනිමින් ප්‍රධාන තේමා සහ තවත් උපතේමා කිහිපයක් ඔස්සේ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. මෙහිදී හඳුනා ගත් සොයාගැනීම් කිහිපයකි. නැවත පදිංචි කිරීමත් සමඟ ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වයේ වෙනසක් හඳුනා ගත හැකි විය. එනම් ගුණාත්මක මට්ටමක පවතින නිවාස හිමි වීම, වෘත්තීමය ස්වභාවය වෙනස් වීම, ආදායම තුළ වෙනසක් සිදුවූවත් එය ජීවන මට්ටමට ප්‍රමාණවත් වීම, ආර්ථික ශක්‍යතාව වෙනස් වුව ද එහි සම්පූර්ණ බිඳ වැටීමක් සිදු නොවීම හඳුනා ගත හැකි විය. නව ප්‍රදේශය තුළ හිමි වී ඇති පහසුකම් හා සේවා වන ප්‍රවාහන, අධ්‍යාපන, සෞඛ්‍ය සහ විවිධ සේවාවලට ඇති ප්‍රවේශය සම්බන්ධයෙන් ප්‍රජාව තුළ පූර්ව ප්‍රදේශයට සාපේක්ෂව තෘප්තිමත් වූ සාධනීය ආකල්ප පවතී. පූර්ව ප්‍රදේශය දැඩි අවදානම් සහගත වූයෙන් අනෙක් සියල්ලටම වඩා ඔවුන් සිය ජීවිතය වැදගත් කොට සැලකීම විශේෂයෙන් හඳුනා ගත හැකි වූ අතර එනිසාම නව ප්‍රදේශය තුළ ජීවත් වීමට බහුතර ප්‍රජාවක් රුචිකත්වයක් දක්වති. එනිසා නායයාම් අවදානම හේතුවෙන් සිදු කළ නැවත පදිංචි කිරීම පිළිබඳව බහුතර ප්‍රජාව තෘප්තිමත් වන හෙයින් මෙම නැවත පදිංචි කිරීම ධනාත්මක වූවක් ලෙස හැඳින්විය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *ස්වාභාවික ආපදා, අවදානම, ආකල්ප, නැවත පදිංචි කිරීම*